වවුනියාව උතුර ප්‍රාදේශිය සභාව

වවුනියාව දිස්ත්‍රික්කය

-------------------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 05 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 26 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ සඳහන් කරුණු වලින් මුල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම් හැර, 2013 දෙසැම්බර් 31 දිනට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මුල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන පරිදි පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3. මුල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුල්‍ය ප්‍රකාශ සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදි යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩල ණය අයකිරීමේදී වැඩිපුර අයකරගන්නා ලද රු.3,360 ක මුදල ණයගැති අවසාන ශේෂයට ගලපා නොතිබුණි.

(ඇ) 2013 අවසන් ගිනුම් වලට අමුණා තිබුණු ලැයිස්තුව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත යුතු අත්තිකාරම් මුදල් ප්‍රමාණය රු.4,521,716 ක් විය. මෙය ශේෂ පත්‍රයේ රු.7,952,480 ක් ලෙස දක්වා තිබුණු අතර ප්‍රධාන ලෙජරයෙහි ද සටහන් කර නොතිබුණි.

(ඉ) උපයෝගි සේවා සඳහා දෙන ලද රු.12,123,017 ක් වු ණය ප්‍රධාන ලෙජරයෙහි සටහන් කර නොතිබුණි.

(ඊ) 2013 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාල උසාවි දඩ මුදල් ගිණුම්ගත නොකිරිම හේතුකොටගෙන සමුච්චිත අරමුදල් ගිණුම රු.935,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------------

පාලන ගිණුම් ශේෂයන් ප්‍රමාණය රු.1,091,238 ක් වු අතර ශේෂ පිරික්සුම අනුව එය රු.1,523,949 ක් වුයෙන් රු.441,711 ක වෙනසක් ඇති වි තිබුණි.

1.3.3 ලැබිය යුතු මුදල්.

-----------------------

2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ඉක්මවු කාර්ය මණ්ඩල ණය අත්තිකාරම් ප්‍රමාණය රු.228,051 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

----------------------------------------------

(අ) අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,539,939 ක් වු ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) වටිනාකම රු.14,922,174 ක් වු ස්ථාවර තැන්පතු සහතික විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.7,986,051 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.8,803,885 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපණම් හා බදු | 2,732,000 | 978,681 | 1,753,319 |
| බලපත්‍ර ගාස්තු | 219,700 | 158,065 | 61,635 |
| වෙනත් ආදායම් | 15,818,000 | 18,706,475 | - |
| එකතුව | 18,769,700 | 19,843,221 | 1,814,954 |

2.3 උසාවි දඩ

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයවිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය රු.935,500 ක් විය.

2.4 මුද්දර ගාස්තු

-----------------

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.419,550 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------------

(අ) දැන්වීම් පුවරුවලට අදාළ දැන්වීම් ප්‍රචාරක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම දැන්වීම් පුවරු වෙනුවෙන් වූ හිඟ මුදල් අයකර ගැනිමටද කටයුතු කර නොතිබුණි.

(ආ) රු.14,922,174 ක් වූ ස්ථාවර තැන්පත් සම්බන්ධයෙන් වූ සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පරිගණක පුටු 3 ක වටිනාකම වූ රු.29,853 ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි.

(ඈ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද දෛනික ධාවන සටහන් පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

i. වාහනය භාවිතා කළ නිලධාරීන්ගේ කෙටි අත්සන් ලබාගෙන නොතිබුණි.
ii. ධාවනය කළ දුර ප්‍රමාණය සහ ගමන් කළ ස්ථාන ඇතුලත් කර නොතිබුණි.
iii. ධාවන සටහන් පූර්ණ වශයෙන් භාවිතා කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

(අ) 2013 දෙසැම්බර් 31 දින වනවිට ලංකා බැංකු ජංගම ගිණුමෙහි වූ රු.161,325 ක් වූ ශේෂය වර්ෂ 6 කට අධික කාලයක් අක්‍රීයව තිබුණි.

(ආ) වටිනාකම රු.130,150 ක් වූ කණු 237 ක් වර්ෂ 2 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව තිබුණි.

4. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම්